# මාධ්‍යවේදියෙක් ලෙස තනිව වාර්තාකරණයේ යෙදීමේදී අනුගමනය කළ යුතු ආරක්ෂක ක්‍රියාමාර්ග

Internews
Local voices. Global change.

දීර්ඝ වූ සිවිල් විරෝධතාවන්හීදී නැවත නැවත තනිවම වාර්තාකරණයේ යෙදීමට සිදු වනු ඇත. ඔබගේ සහෘද මාධ්‍යවේදී කණ්ඩායමක් සමඟ වාර්තාකරණ කටයුතුවල නියැලී සිටියද ඔබට එම ස්ථානයේ සිට තනිව ම රාජකාරී ඉටු කිරීමට සිදු වීමේ සම්භාවිතාව ඉහළ යා හැකි වන අතරම ඔබට ඒ අයගෙන් වෙන්ව කටයුතු කිරීමට ද සිදු වනු ඇත. එබැවින්, තනිව ම වාර්තාකරණයේ යෙදෙන මාධ්‍යවේදීන් අනතුරුදායක තත්ත්වයන් තක්සේරු කර එම අනතුරු අවම කිරීම සඳහා පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ.

## සූදානම

ඔබ වාර්තාකරණය සිදු කිරීමට පෙර, ඔබ දැනට මුහුණ දෙමින් සිටින හෝ ඉදිරියේ දී සිදු කිරීමට බලාපොරොත්තු වන වාර්තාකරණයන් හේතුවෙන් ඔබට මුහුණ දීමට සිදු විය හැකි, ආරක්ෂාව පිළිබඳ අවදානම් තත්ත්වයන් තක්සේරු කර බලන්න. නව පැවරුමක් ලබා ගැනීමට තීරණය කිරීමට පෙර ඒවා ඇගයීමට ලක් කර  නිසි ක්‍රියාමාර්ග සකසා ගන්න.

ප්‍රවෘත්ති කාමරයේ ඔබගේ අධීක්ෂකයන් සහ සමීපත මාධ්‍ය සගයන් සමඟ පැවරුම පිළිබඳව සහ ඇති විය හැකි තත්ත්වයන් පිළිබඳව සාකච්ඡා කරන්න.

වාර්තාකරණයේ යෙදෙන ස්ථානය, ප්‍රවාහනය සහ වාර්තාකරණය සිදු කරන කාලසීමාවේදී ඔබහට අවදානමක් ඇති වීමේ ඉඩකඩක් පවතී ද යන්න තක්සේරු කර බලන්න. එලෙස, අවදානම් සහගත තත්ත්වයක් පවතී නම්, එය අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ඔබ සතුව පවතීද යන්න විමසා බලන්න.

විරෝධතාකරුවන්, ආරක්ෂක අංශ සහ ඔබ අසල ගැවසෙන්නන් වැනි පුද්ගලයන් මඟින් ඔබහට අවදානමක් ඇති විය හැකි ද යන්න සොයා බලන්න. ඔබ එම ස්ථානයේ සිට වාර්තාකරණය සිදු කරන්නේ කෙසේදැයි සැලසුම් කරන්න.

ඔබත් සමඟ වාර්තාකරණය සිදු කරන අන් අය කවරේ ද, ඔවුන් විශ්වාස කළ හැකි ද? විරෝධතා පවතින ස්ථානය තුළදී ඔබ එකිනෙකා සමඟ සන්නිවේදනය කිරීමට සැලසුම් කරන්නේ කෙසේද සැලසුම් කරන්න. දැඩි අවදානම් සහිත ස්ථානයන්හි සිට වාර්තා කිරීමේ දී, ඔබගේ සහෘද මාධ්‍යවේදීන් පෙනෙන මානයේ සිටීම ආරක්ෂාකාරී ය.

විරෝධතා ස්ථානයට ගමන් කිරීමේදී සැලසුමක් සකස් කර එය ක්‍රියාත්මක කරන්න. මෙය විශ්වාසවන්ත සහෘදයෙකු සමඟ හෝ සමීපතමයෙකු සමඟ හෝ එම දෙදෙනා සමඟ ම හෝ සකස් කළ එකක් විය හැකි ය. සැලසුම මඟින් නිරන්තරයෙන් එකිනෙක අතර පණිවිඩ හුවමාරු දාමයක් ක්‍රියාත්මක කළ යුතු අතර එමඟින් ඔබට වහා සහාය විය හැකි පුද්ගලයෙකුට ඔබ යන එන ස්ථාන සහ ඔබගේ වාර්තාකරණ තත්වයන් පිළිබඳ නිරන්තරයෙන් අවධානයෙන් සිටිය හැකි වේ.





වාර්තාකරණයේ යෙදී සිටියදී ඇතිවන හදිසි තත්ත්වයන් මත මාධ්‍ය සගයන්ගෙන් වෙන් වීමට සිදුවීම, ප්‍රාණ ඇපකරුවෙක් ලෙස පත්වීමට ඇති ඉඩකඩ වැනි හදිසි, දැඩි අවදානම් තත්වයන්හී දී ක්‍රියා කිරීමට අවශ්‍ය ආරක්ෂක සහ සන්නිවේදන ක්‍රමවේදයක් වාර්තාකරණය වෙත ප්‍රවිශ්ඨ වීමේ සැලසුම් යටතේ ඇතුළත් කරන්න.

විරෝධතාවයේ යෙදී සිටියදී ඔබ සමාජ ජාල මාධ්‍ය තුළ ක්‍රියාකාරීව සිටින්නේ නම් එහි ඔබ සිටින ස්ථානය හඳුනාගැනීමට ඇති ඉඩකඩ පිළිබඳව අවධානය යොමු කරන්න. එමෙන්ම, ඔබ ස්ථාන සම්බන්ධව සේවාව (Location Service) භාවිත කරන්නේ කුමන අවස්ථාවල කුමන ආකාරයෙන්ද යන්න සිහි තබා ගන්න.






ඔබගේ මාධ්‍ය උපකරණ ආරක්ෂා කරගන්න. වාර්තාකරණ කටයුතු සඳහා යන විට අවශ්‍ය දෑ පමණක් රැගෙන යන්න. ඔබගේ මාධ්‍ය උපකරණ රක්ෂණය කර ඇත්ද? එසේ නම්, එම රක්ෂණ සමාගම කුමක්ද? එසේ නොමැති නම්, හානියක් සිදු වූ අවස්ථාවක එහි පාඩුව දරන්නේ කවුරුන් විසින් ද? යන්න සිහි තබාගන්න.

ඔබගේ කායික සහ මානසික සෞඛ්‍ය තත්ත්වයන් නිරන්තරයෙන් ඇගයීමට ලක් කරන්න. වාර්තාකරණය නිසා ඔබගේ කායික සහ මානසික යහපැවැත්මට අයහපත් ලෙස බලපෑ හැකි ඕනෑම තත්ත්වයක් ඔබ විසින් ම තක්සේරු කොට අවශ්‍ය නම්, ඒ සඳහා නිසි ක්‍රියාමාර්ග ගන්න.





ඔබ විසින්ම ඔබගේ වාර්තාකරණය සඳහා සහාය විය යුතු ආකාරය පිළිබඳ සැලසුම් නිර්මාණය කර යාවත්කාලීන කරන්න. මෙම සැලසුම් තුළ මූල්‍ය අවශ්‍යතා, ආහාර, නවාතැන් වැනි කරුණු මනා ලෙස අන්තර්ගත විය යුතු ය.

වාර්තාකරණ පැවරුම කෙතරම් දීර්ඝ වුව ද, කෙතරම් අත්‍යවශ්‍ය වුව ද, ඔබට විවේකයක් නොමැතිව රාජකාරී ඉටු කිරීමට නොහැකි ය. එබැවින් දිගු සහ කෙටි විවේක කාල ඔබගේ වාර්තාකරණ වැඩ පිළිවෙල තුළ සැලසුම් කර ක්‍රියාත්මක කරන්න.



# විරෝධතා භූමිය තුළ වාර්තාකරණය අතරතුර



විරෝධතා ස්ථානය  වෙත යාමට ඔබ භාවිත කරනු ඇති ප්‍රවාහන ක්‍රමය වෙත අවධානය යොමු කරන්න. පොදු ප්‍රවාහන සේවාව භාවිත කිරීම ආරක්ෂාකාරී ද? තනිව තම මෝටර් රථය හෝ මෝටර් සයිකලය පදවන්නේ නම්, එය ආරක්ෂාකාරී ද? ඔබ ගමන් කරන කාලය සහ ඔබ භාවිත කරන  මාර්ග පිළිබඳ අවධානය යොමු කරන්න. නැවත පැමිණෙන්නේ කෙසේද? යන්න පිළිබඳව ද සලකා බලන්න.

ඔබ විසින් සිදු කරන වාර්තාකරණයේදී අවශ්‍ය වන තොරතුරු හා කරුණු පිළිබඳ පැහැදිලි අදහසක් තබාගන්න. ඔබට ප්‍රමාණවත් තරම් කරුණු ලැබුණු විට එම ස්ථානයෙන් පිටව යන්න. දැඩි අවදානම් කලාප තුළ හැකිතාක් දුරට ප්‍රමාද වීමෙන් වළකින්න.





විශ්වාසවන්ත සහෘදයෙකු හෝ සමීපතමයෙකු සමඟ එක්ව, දවසේ වාර්තාකරණය සඳහා ගමන් සැලසුම්, කාර්යසටහන් සහ පිවිසුම් පිළිබඳ ආරක්ෂක ක්‍රමවේදයක් සකසන්න. සැම විටම එම ක්‍රමවේදයට අනුව කටයුතු කරන්න.

ඔබ වාර්තාකරණයට කරුණු සම්පාදනය කරනු ලබන්නේ කුමන ස්ථානයක සිට ද? එම ස්ථානය ආරක්ෂාකාරී ද? ඔබ නිවසෙන් හෝ කාර්යාලයයෙන් බැහැර ස්ථානයක සිට වාර්තාකරණයේ යෙදෙන්නේ නම්, එම ස්ථානය ආරක්ෂාකරීද? යන්න සහ එම අවකාශය භාවිත  කරන අන් අය කවුද? යන්න පිළිබඳව සැමවිටම අවධානය යොමු කරන්න.





කිසිදු අවස්ථාවක වාර්තාකරණය වෙනුවෙන් ඔබගේ හෝ අන් අයගේ ආරක්ෂාව අවදානමට ලක් නොකළ යුතු ය.

මූලික වශයෙන්, ඔබගේ වාර්තාකරණ පැවරුම් තනිව සිදු කරන වාර්තාකරණ ප්‍රයත්නයන් ලෙස සැලසුම් කළ යුතුය. සියලු සැලසුම්, ක්‍රමවේද සහ අවදානම් තක්සේරු කිරීම්, මෙම කරුණ සැලකිල්ලට ගෙන ඇගයීමට ලක් කළ යුතුයි.